# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2414/14 - 2024 දෙසැම්බර් මස 11 වැනි බදාදා - 2024.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

86(7) වගන්තිය යටතේ වන නියෝගය

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, විජේසිංහ ආරච්චිගේ සේපාලිකා චන්ද්‍රසේකර වන මා විසින් 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 86 වැනි වගන්තියේ (7) වැනි උපවගන්තිය යටතේ වන මෙම නියෝගය මගින්, 2017 අංක 24 දරන දේශිය ආදායම් පනතේ VIII වැනි පරිච්ඡේදයේ II වැනි කාණ්ඩය යටතේ නිර්වාසික තැනැත්තකුට කරනු ලබන යම් ගෙවීමකින් බදු රඳවා ගැනීමේ කාර්යපටිපාටිය මෙහි සඳහන් උපලේඛනයෙන් නිශ්චිතව දක්වනු ලැබේ. බාහිර ප්‍රේෂණවල නියුතු සියලුම බලපත්‍රලාභි වාණිජ බැංකු සහ බලයලත් වෙළෙන්දන් සහ බාහිර ප්‍රේෂණ සිදු කරන තැනැත්තන් විසින් එම කාර්යපටිපාටියට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතුය.

මෙම රෙගුලාසි 2025 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**විජේසිංහ ආරච්චිගේ සේපාලිකා චන්ද්‍රසේකර,**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ 02.
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

**1. මෙම කාර්යපටිපාටියට අනුකූලව කටයුතු කළ යුතු තැනැත්තන්**

2017 අංක 24 දරන (සංශෝධිත) දේශීය ආදායම් පනතේ 83අ, 84, 84අ සහ 85 වන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තකු වෙත ගෙවීම් කරන රඳවා ගැනීමේ අනුයෝජිතයන් සහ බාහිර ප්‍රේෂණවල නියුතු සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලයලත් වෙළෙන්දන් මෙම කාර්ය පටිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් මගින් උපයා ගන්නා ගෙවීමක් හැර නිර්වාසික තැනැත්තකු වෙත කරන ගෙවීමක දී ශ්‍රී ලංකා ආණ්ඩුව යටතේ වන රජයේ ආයතන ද මෙම කාර්ය පටිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය.

**2. බදු නිෂ්කාශනයක අවශ්‍යතාවය**

දේශීය ආදායම් පනතේ (සංශෝධිත) 83අ, 84, 84අ සහ 85 වගන්ති ප්‍රකාරව නිර්වාසික තැනැත්තකු හට සිදුකරන ගෙවීම් මත පනවා ඇති රඳවා ගැනීමේ බද්ද (එයට අත්තිකාරම් ආදායම් බද්ද ද ඇතුළත් වේ.) එකතු කිරීම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරන අතර අදාළ බාහිර ප්‍රේෂණ කාර්යය සඳහා බදු නිෂ්කාශන සහතිකයක්, රඳවා ගැනීමේ අනුයෝජිතයා වෙත නිකුත් කළ යුතුය.

කෙසේ නමුදු ඍණාත්මක ලැයිස්තුවේ (පහත අයිතම 3 හි) සඳහන් බාහිර ප්‍රේෂණ සම්බන්ධයෙන් බදු නිෂ්කාශන සහතිකයක් අවශ්‍ය නොවේ. ඍණාත්මක ලැයිස්තුවේ සඳහන් කර නොමැති අනෙකුත් සියළු ගෙවීම් සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් බදු නිෂ්කාශන සහතිකයක් ලබා ගත යුතුය.

**3. ඍණාත්මක ලැයිස්තුව**

(i) යම් ස්පර්ශනීය වූ භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ප්‍රේෂණ

(ii) ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක, නිර්වාසිකයකු විසින් හිමිකාරිත්වය දරන නිල ලැයිස්තුගත කොටස් විකිණීමෙන් ලබන ලාභය ප්‍රේෂණය කිරීම

(iii) යම් ලාභාංශයක් 15%ක අනුප්‍රමාණයකින් අත්තිකාරම් ආදායම් බද්දට යටත් වී ඇති නම් හෝ යම් ලාභාංශයක් ආදායම් බද්දෙන් නිදහස් නම්, අදාළ කොටස් හිමියන්ට කරනු ලබන ලාභාංශ ප්‍රේෂණ (15% බදු අඩු කිරීම සනාථ කිරීම සඳහා, බාහිර ප්‍රේෂණ අරමුණු සඳහා සාක්ෂියක් ලෙස රඳවා ගැනීමේ සහතිකයක් භාවිතා කළ යුතුය.)

(iv) බාහිර ආයෝජන ගිණුමක් විවෘත කිරීම සඳහා දැනටමත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙතින් බදු නිෂ්කාශන සහතිකයක් ලබාගෙන තිබේ නම්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ වන රෙගුලාසිවල දක්වා ඇති සීමාවන්ට සහ නියමයන් හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දන් සමග සුදුසුකම්ලත් වාසික තැනැත්තකු විසින් විවෘත කරන ලද එවැනි බාහිර ආයෝජන ගිණුමකින් කරනු ලබන බාහිර ප්‍රේෂණ

(v) පහත සඳහන් අදාළ ප්‍රවාහන ව්‍යාපාරයක් පවත්වාගෙන යන නිර්වාසික තැනැත්තකු විසින් ලබන ගෙවීම් ප්‍රේෂණ -

අ. ශ්‍රී ලංකාවෙන් බැස යන මගීන් රැගෙන යාම (රට ඇතුළට පැමිණෙන මගීන් සම්බන්ධයෙන්) හෝ
ආ. ශ්‍රී ලංකාවෙන් ගොඩබසින භාණ්ඩ, තැපැල හෝ වෙනත් චංචල ස්පර්ශනීය වත්කම් ප්‍රවාහනය කිරීම (ස්පර්ශනීය භාණ්ඩ ආයතනය සම්බන්ධයෙන්)

(vi) ශ්‍රී ලංකා රජයෙන් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රේෂණ (2015.11.01 දින හෝ එදිනට පසු ස්ථිරව ශ්‍රී ලංකාව හැර ගිය විශ්‍රාම වැටුප් ලබන්නන් හැර)

(vii) ශ්‍රී ලංකාවෙන් පිටත වෙළඳනාම ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අපනයන සමාගම් විසින් සිදු කරනු ලබන ප්‍රේෂණ

(viii) වෘත්තීය මණ්ඩලවල වාර්ෂික සාමාජිකත්ව දායක මුදල් හෝ ජර්නල්, සඟරා සහ වෙනත් ප්‍රකාශනවල වාර සාමාජිකත්ව දායකත්වයන් සම්බන්ධයෙන් වන ප්‍රේෂණ

(ix) ශිෂ්‍යයන් සම්බන්ධයෙන් පාඨමාලා ගාස්තු, විභාග ගාස්තු, ඇතුළත්වීමේ ගාස්තු, ජීවන වියදම් සහ ඒ හා සමාන ස්වභාවයේ ගෙවීම් හා සම්බන්ධ ප්‍රේෂණ

(x) වීසා වියදම්, වෛද්‍ය වියදම්, ගුවන් ගමන් වියදම් සහ පිටරට හෝටල්වල නවාතැන් ගැනීම සඳහා වන වියදම් සම්බන්ධයෙන් වන ප්‍රේෂණ

(xi) ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තකුට ප්‍රදානය කළ ඕනෑම ණයක් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සිටින ඕනෑම තැනැත්තකුට සිදු කළ ප්‍රාග්ධන නැවත ගෙවීම් හෝ පොලී ගෙවීම් හා සම්බන්ධ ප්‍රේෂණ

(xii) ලියාපදිංචි ගාස්තු ද ඇතුළුව විදේශ සමුළු, සම්මන්ත්‍රණ සහ දූත මණ්ඩල සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් වන ගෙවීම් සඳහා ප්‍රේෂණ

(xiii) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFC ගිණුම්) හරහා සිදු කරන ප්‍රේෂණ

(xiv) ශ්‍රී ලංකා රජය මගින් හෝ වෙනුවෙන් දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කර නිකුත් කළ ස්වෛරී බැඳුම්කරයක් මත පොළිය, වට්ටම හෝ උපලබ්ධිවීම මත වන යම් ලැබීමක් ගෙවීම සඳහා හෝ ශ්‍රී ලංකා රජය මගින් හෝ වෙනුවෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් වන පොළිය හෝ වට්ටම ගෙවීම් සඳහා වන ප්‍රේෂණ

(xv) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව බාහිර ප්‍රේෂණ ලබන්නකු (තැන්පතු හිමියකු) විසින් ඕනෑම වාණිජ බැංකුවක හෝ ඕනෑම විශේෂිත බැංකුවක විවෘත කර පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් මගින් 2020.01.01 දින හෝ එදිනට පසු ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ඉපයූ පොළී ප්‍රේෂණ

(xvi) රසායනාගාර සේවා හෝ ප්‍රමිතිගත සහතික සේවා (2020.01.01 දින හෝ එදිනට පසු සේවා ගෙවීම් සම්බන්ධයෙන්) ගෙවීම් සඳහා ප්‍රේෂණ

(xvii) ජාත්‍යන්තර සංවිධානයක් සහ ශ්‍රී ලංකා රජය අතර වූ ගිවිසුමක් යටතේ සලසන ලද නිදහස් කිරීමක්, තානාපති විනිර්මුක්ති නීතියක් හෝ සමාන නීතියක් යටතේ සලසන ලද නිදහස් කිරීමට වඩා පුළුල් නම්, ඒ තානාපති විනිර්මුක්ති නීතිය හෝ සමාන නීතිය යටතේ හෝ, එම සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අතර වූ ගිවිසුම යටතේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට ජාත්‍යන්තර සංවිධානයක් මගින් කරනු ලබන ප්‍රේෂණ

(xviii) ගුවන්යානා, මෘදුකාංග බලපත්‍ර හෝ අනෙකුත් ඒ හා සම්බන්ධ සේවා සඳහා ඕනෑම නිර්වාසික තැනැත්තකුට ශ්‍රී ලංකා ගුවන් සමාගම විසින් සිදු කරන ගෙවීම්වල ප්‍රේෂණ

(xix) (අ) තානාපති විනිර්මුක්ති නීතියක් හෝ සමාන නීතියක් මගින්; හෝ

(ආ) වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ වරප්‍රසාද සහ විනිර්මුක්තීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ආයතනයන්ගේ සම්මුතිය බලාත්මක කරනු ලබන පනතක් මගින්;

විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට වරප්‍රසාද හිමි විය යුතු, විශේෂ හැඳුනුම්පතක් (බදු නිදහස් කිරීම නිශ්චිතව දක්වා ඇති) පිරිනැමීම මගින් විදේශ අමාත්‍යාංශය විසින් පිළිගත් ඕනෑම රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩල සාමාජිකයකු (දේශීය කාර්ය මණ්ඩලය හැර) විසින් උපයනු ලබන ආදායම් ප්‍රේෂණ

(xx) තානාපති විනිර්මුක්ති නීතියක් හෝ සමාන නීතියක් හෝ යටතේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට විදේශීය රටක හෝ විදේශීය භූමි ප්‍රදේශයක (රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය) රජය විසින් කරනු ලබන ප්‍රේෂණ

(xxi) සේවා නියුක්තිකයින්ගේ පාරිශ්‍රමික ගෙවීම් (අධ්‍යක්ෂවරුන් විසින් ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙන් මුදල් හෝ මුදල් නොවන ප්‍රතිලාභ ලෙස පාරිශ්‍රමික ලබා ගත්ත ද උපයා ගත්ත ද ඔවුන්ගේ එම පාරිශ්‍රමික ද ඇතුළුව) අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු යෝජනා ක්‍රමයට සහ අදාළ සේවායෝජකයා විසින් නිකුත් කරනු ලබන ආදායම් බදු අඩු කිරීමේ සහතිකයට (සේවායෝජකයාට එවැනි සේවකයකුට සේවා නියුක්තික ආදායම සඳහා තක්සේරු වර්ෂය ආරම්භයේ සිට සහතිකය නිකුත් කරන දිනය දක්වා කාල සීමාව සඳහා මෙම කාර්යය සඳහා පමණක් භාවිත කළ හැකි T-10 සහතිකයක් නිකුත් කළ හැකිය.) (T-10) යටත් වන්නේ නම් එවැනි පාරිශ්‍රමික ගෙවීම් ප්‍රේෂණ

**4. බදු නිෂ්කාශන සහතික ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය**

සෘණාත්මක ලැයිස්තුවේ (අයිතමය 3) ගෙවීම් හැර අනෙකුත් ගෙවීම් සම්බන්ධයෙන් බාහිර ප්‍රේෂණ සිදුකරන තැනැත්තකු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් "බදු නිෂ්කාශන සහතිකයක්" ලබාගත යුතුය. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් එකී සහතිකය නිෂ්කාශන හා විධාන අංශයේ කොමසාරිස්වරයා විසින් නිකුත් කෙරේ. (2 වන මහළ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. දු. ක. +94112134204 විද්‍යුත් තැපැල bc@ird.gov.lk).

ඉල්ලුම්කරු විසින් තම ඉල්ලීම, අදාළ විශේෂිත ආකෘතිය පමණක් භාවිතා කර ඉන්වොයිසිවල, ගිවිසුම්වල සහ අනෙකුත් අදාළ ලිපිලේඛනවල පිටපත් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. විශේෂිත ආකෘතිය (ආකෘති අංක :- Sec/2018/03_Form 01) දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය www.ird.gov.lk මගින් බාගත කර ගැනීමට හැකිය.

**5. පොදු තොරතුරු**

(i) ශ්‍රී ලංකාව සහ අනෙක් රට අතර පවතින අදාළ ද්විත්ව බදුකරණ වැළැක්වීමේ ගිවිසුමේ විධිවිධානවලට යටත්ව දේශීය ආදායම් පනතේ සංශෝධිත විධිවිධාන පදනම් කරගනිමින් අදාළ කර ගත යුතු රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණය තීරණය කෙරෙනු ඇත. අදාළ කර ගත යුතු ද්විත්ව බදුකරණ වැළැක්වීමේ ගිවිසුම යටතේ වන ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස රඳවා ගනු ලැබීමට යටත්වන්නාගේ බදු වාසිකත්ව සහතිකය ඉදිරිපත් කළ යුතුය.

(ii) ප්‍රේෂණ සිදුකරන තැනැත්තා දළ මුදල් ප්‍රමාණය මත බදු අනුප්‍රමාණය අදාළ කරගනිමින් (ඉන්වොයිසියේ සඳහන් දළ මුදල) නියමිත රඳවා ගැනීමේ බදු බැඳියාව ගෙවිය යුතු අතර ශුද්ධ මුදල් ප්‍රමාණය පමණක් ප්‍රේෂණය කිරීමට ඉඩ ලබා දෙයි. ඕනෑම ඉන්වොයිසියක මුළු මුදල් ප්‍රමාණය ප්‍රේෂණය කිරීමට අපේක්ෂා කරන තැනැත්තකු, එකී අවස්ථාවේ දී ඉන්වොයිසිගත මුදල් ප්‍රමාණය ශුද්ධ මුදල් ප්‍රමාණය ලෙස සලකා දළ-ඉහළ මුදල් ප්‍රමාණය (grossed up amounts) මත පදනම්ව අදාළ රඳවාගැනීමේ බද්ද ගණනය කළ යුතුය.

(iii) ප්‍රේෂණ දිනයේ දී විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ පළ කර ඇති ව්‍යවහාර මුදල් අනුප්‍රමාණ (විකුණුම් අනුප්‍රමාණය) අදාළ කර ගැනීම අදාළ තැනැත්තා විසින් සිදු කිරීම අවශ්‍යය.

(iv) ප්‍රේෂණය කිරීමට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත අදාළ රඳවාගැනීමේ බද්ද ගෙවිය යුතුය. බදු මුදල් ගෙවීමෙන් පසු ඉතිරි මුදල් ප්‍රමාණය පමණක් ප්‍රේෂණය කිරීමට ඉඩ ලබා දේ.

**6. බාහිර ප්‍රේෂණයන්හි නිරත බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලයලත් වෙළෙන්දන් සඳහා වන ක්‍රියාපටිපාටිය**

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලයලත් වෙළෙන්දන් විසින් ඍණාත්මක ලැයිස්තුවේ (අයිතමය 3) සඳහන් ගෙවීම් සම්බන්ධයෙන් බාහිර ප්‍රේෂණයන් සිදුකරන තැනැත්තන්ගෙන් බදු නිෂ්කාශන සහතිකයක් ඉල්ලා සිටීම අවශ්‍ය නොවේ. කෙසේ නමුදු 7 වන අයිතමය යටතේ සඳහන් කර ඇති පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත භාරදිය යුතු තොරතුරු සැපයීමට අවශ්‍ය තොරතුරු එක්රැස් කර ගත යුතුය.

අනිකුත් සියළුම බාහිර ප්‍රේෂණ සඳහා, සෑම බලපත්‍රලාභී බැංකුවක් සහ බලයලත් වෙළෙන්දෙකු විසින්ම බාහිර ප්‍රේෂණයන්ට පෙරාතුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ වලංගු බදු නිෂ්කාශන සහතිකයක් ඉල්ලා සිටිය යුතුය.

කිසිදු තත්ත්වයක් යටතේ බලපත්‍රලාභී බැංකුවක් හෝ බලයලත් වෙළෙන්දකු විසින් රඳවාගැනීමේ අනුයෝජිතගේ නියමිත රඳවාගැනීමේ බද්ද එකතු නොකළ යුතුය.

**7. වාර්තා තබාගැනීමේ සහ තොරතුරු භාරදීමේ අවශ්‍යතාවය**

(i) විදෙස් බාහිර ප්‍රේෂණවල නිරත වීමට අධිකාරී බලය සහිත සියළුම වාණිජ බැංකු සහ බලයලත් **වෙළෙඳුන් විසින්** <u>ඕනෑම ස්පර්ශීය / ස්පෘශ්‍ය භාණ්ඩයක් ආනයනය</u> සඳහා වන ප්‍රේෂණ හැර සියළුම බාහිර ප්‍රේෂණ (ඍණාත්මක ලැයිස්තුවේ ඇති ගෙවීම් ද ඇතුළුව) සම්බන්ධයෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි වාර්තා පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

**බාහිර ප්‍රේෂණ උපලේඛනය**

බැංකුවේ/ බලයලත් වෙළෙන්දාගේ නම: ..............................................................................................................

..........................................................................................................................................................................

ශාඛාව: ....................................... දුරකථන අංකය: ............................................

මාසය: ....................................... වර්ෂය: ..........................................................

කාලපරිච්ඡේදය: ............................ සිට ................................................ දක්වා

| අනුක්‍රමික අංකය | ප්‍රේෂණය කරන්නාගේ නම | ප්‍රේෂණය කරන්නාගේ බ.ගෙ.හ.අ./බදු ගෙවනු අංකය (තිබේ නම්) | ලබන්නාගේ නම | ප්‍රේෂණය කළ රට | ප්‍රේෂණ දිනය | ඉන්වොයිසි අංකය | ඉන්වොයිසිගත මුදල් ප්‍රමාණය | ප්‍රේෂණය කළ මුදල | ප්‍රේෂණය කරන්නා විසින් දේ.ආ.කො.ජ. වෙත ගෙවූ ර.ගැ.බ. මුදල් ප්‍රමාණය | බදු නිෂ්කාශන සහතික යොමු අංකය | ප්‍රේෂණවල අරමුණ (බදු නිෂ්කාශන සහයා නොමැති නම්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

බලයලත් නිලධාරියාගේ නම ..........................................................................................................

බලයලත් නිලධාරියාගේ තනතුර ..........................................................................................

අත්සන ................................................................. දිනය ..................................................

(ii) ඉක්බිතිව එළඹෙන මාසයේ 10 වන දින හෝ එදිනට පෙර මාසික උපලේඛනය (ඉහත ආකෘති පත්‍රය අනුව) විද්‍යුත් තැපැල් ඇමුණුමක් මගින් Excel ආකෘතිය භාවිතා කර bc@ird.gov.lk වෙත එවීමට බලපත්‍රලාභී වෙළඳ බැංකුවක් හෝ බලයලත් වෙළෙන්දෙකු විසින් කටයුතු කළ යුතුය. උපලේඛනය ලැබුනු බවට තහවුරු කිරීමේ පිළිතුරක් අදාළ තැනැත්තා වෙත යොමු කිරීම නිෂ්කාශන හා විධාන අංශයේ කොමසාරිස්වරයා විසින් සිදු කළ යුතුය.

(iii) රඳවාගැනීමේ අනුයොජිතයින් අදාළ තක්සේරු වර්ෂයේ ගෙවීම් තොරතුරු රඳවාගැනීමේ බදු/ අත්තිකාරම් ආදායම් බදු වාර්ෂික ප්‍රකාශයේ ප්‍රකාශ කළ යුතුය.

8. මෙම රෙගුලාසිවල අරමුණ සඳහා. "බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ එම පදය සඳහා නියම කර ඇති අර්ථයම තිබිය යුතුය.

9. **බදු නිෂ්කාශන අයඳුම්පත්‍රයේ ආකෘතිය**

**බදු නිෂ්කාශන අයඳුම්පත්‍රය**

ලියාපදිංචි අංකය [ ]

| | | |
|---|---|---|
| 1 | **ප්‍රේෂණය කරන්නාගේ විස්තර**<br>දේශීය සමාගම<br>නම:<br><br>ලිපිනය :<br><br>බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය : ............................................................ | **ප්‍රේෂණය කරන්නාගේ විස්තර**<br>විදේශීය සමාගම<br>නම : ........................................<br>........................................<br>රට : ........................................<br>බදු ගොනු අංකය (තිබේ නම්)<br>[ ] [ ] [ ] |

| | |
|---|---|
| 2 | **ප්‍රේෂණ පිළිබඳ විස්තර**<br><br>ප්‍රේෂණයේ ස්වාභාවය: ........................................................................<br>........................................................................<br><br>ඉන්වොයිස් අංකය: ........................................................................<br>........................................................................<br><br>මුළු ඉන්වොයිස් වටිනාකම [ ]    ප්‍රේෂණය කරන මුදල [ ]    ව්‍යවහාර මුදල [ ] |

3 **බදු ගණනය (බදු බැඳියාව සහිත සිද්ධි සඳහා පමණක් අදාළ වේ)**

| | |
|---|---|
| *ශුද්ධ මුදල් ප්‍රමාණය ප්‍රේෂණය කළහොත්<br>[ ] (ඉන්වොයිසියේ සඳහන් මුදල් ප්‍රමාණය) X [ ] (අදාළ බදු අනුප්‍රමාණය) / 100<br>ව්‍යවහාර මුදල [ ] බදු ප්‍රමාණය [ ] | *දළ මුදල් ප්‍රමාණය ප්‍රේෂණය කළහොත්<br>[ ] (ඉන්වොයිසියේ සඳහන් මුදල් ප්‍රමාණය) X [ ] (අදාළ බදු අනුප්‍රමාණය)<br>ව්‍යවහාර මුදල [ ] බදු ප්‍රමාණය [ ] |
| අදාළ විනිමය අනුපාතය සහ දිනය [ ] [ ] | බදු ගෙවූ මුදල (ලංකා රුපියල්) [ ] |

4 සටහන් (තිබේ නම්): ..........................................................................................................................................

..........................................................................................................................................

*කරුණාකර ඉන්වොයිසි පිටපත, ගිවිසුමේ පිටපත (තිබේ නම්), බදු වාසිකත්ව සහතිකයේ පිටපත (ද්විත්ව බදුකරණ වැළැක්වීමේ ගිවිසුමෙහි ප්‍රතිලාභ සඳහා) සහ ගෙවීමේ පත්‍රිකාවේ පිටපතක් අමුණන්න

..........................................

බලයලත් අත්සන

නම : ..........................................................................

තනතුර හා දුරකථන අංකය : ......................................

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා* පමණි

නිලධාරියාගේ නම [ ]

අත්සන [ ]

විධානය: ..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

EOG 12 - 0106

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.